# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

# (Recovery Plan for Learning Loss – 2022)

# 6 ශ්‍රේණිය ගණිතය


ගණිත දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

www.nie.lk

# හැඳින්වීම

රට තුළ පැන නැඟී තිබූ උග්‍ර ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රවාහන දුෂ්කරතා සහ වෙනත් විවිධ හේතූන් මූලික කර ගනිමින් 2022 වර්ෂය ආරම්භයේ සිට ම වරින් වර පාසල් වසා තැබීම සිදු විය. පාසල් වසා තබන ලද කාල සීමාව තුළ දී ඉගෙනීමේ ක්‍රමය මාර්ගගත ක්‍රමය වෙත මාරු වුව ද මේ සඳහා පහසුකම් සපයා ගත හැකි දරු පිරිස ඉතා සීමිත සංඛ්‍යාවකි. ශ්‍රී ලංකාවේ දුරස්ථ අධ්‍යාපනය ලබා දීමේ ප්‍රවේශය සහ ගුණාත්මකභාවය අතින් බොහෝ අඩුපාඩු පෙන්නුම් කර ඇති අතර මෙම ක්‍රමය හේතුවෙන් ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය ශක්තිමත් වී ඇති අතර සිසුන්ගේ පාසල් කාලය අහිමි වීම තුළ පාසල් ප්‍රජාවගෙන් සිසුන් ඈත්වීම ද යහපත් ප්‍රවනතාවක් නොවන බව දැකිය හැකි ය.

පවතින අභියෝගතා මධ්‍යයේ වුව ද යම්තාක් දුරකට හෝ විධිමත් ලෙස පාසල් පැවැත්වීම අනාගත දරු පරපුරේ අභිවෘද්ධියට හේතු සාධක වනු ඇත. එම අරමුණින් යුතු ව සතියට දින තුනක් පෙ.ව. 7.30 සිට ප.ව. 2.30 දක්වා පාසල් පැවැත්වීමටත් සතියේ ඉතිරි දින දෙක සිසුන්ව නිවසේ සිට අධ්‍යයන කටයුතුවල නිරත කරවීමටත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ නිළධාරීන් විසින් තීරණය කර ඇත. මෙම තීරණයට අනුව හය ශ්‍රේණිය ගණිතය පළමුවන වාරයේ ඉතිරිව ඇති පාඩම් ආවරණය කිරීම සඳහා කාලච්ඡේද 24ක් ද දෙවන හා තුන්වන වාරයේ පාඩම් ආවරණය කිරීම සඳහා කාලච්ඡේද 34ක් බැගින් ද යොජනා කර ඇත. ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ නිළධාරින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිළධාරින්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිළධාරින් සහ පළාත් සම්බන්ධීකරණ නිළධාරින්ගේ සහභාගීත්වයෙන් යුතු ව මෙම 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා වන ප්‍රතිසාධන සැලැස්ම සකස් කර ඇත.

දැනට පවතින හය ශ්‍රේණිය ගණිතය විෂය නිර්දේශය සැලකීමේ දී පළමුවන වාරය සඳහා පාඩම් අටක් ඇතුළත් කර ඇති අතර ඒ සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 53කි. දෙවන වාරය සඳහා පාඩම් නවයක් ඇතුළත් කර ඇති අතර එම පාඩම් ආවරණය සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 65කි. තුන්වන වාරයට පාඩම් අටක් ඇතුළත් කර ඇති අතර එම පාඩම් ආවරණය සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 39කි.

දෙවන වාරය සඳහා පාඩම් නවයක් ඇතුළත් කර ඇති අතර එම පාඩම් ආවරණය සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 65කි. තුන්වන වාරයට පාඩම් අටක් ඇතුළත් කර ඇති අතර එම පාඩම් ආවරණය සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 39කි.

**පළමුවන වාරය සඳහා කාලච්ඡේද 24ක් සහ දෙවන හා තුන්වන වාර සඳහා කාලච්ඡේද 34ක් බැගින් සමානව යෝජනා කර ඇති නිසා මූලික වශයෙන් දැනට පවතින විෂය නිර්දේශයේ පහත සංශෝධන සිදු කරමින් අත්‍යාවශ්‍ය යැයි සළකන විෂය අන්තර්ගතය ඇතුළත් කරමින් මෙම ප්‍රතිසාධන සැලැස්ම සකස් කර ඇත.**

- **පළමුවන වාරයේ 01. වෘත්ත, 02. ස්ථානීය අගය, 03. පූර්ණ සංඛ්‍යා මත ගණිත කර්ම සහ 04. කාලය යන පාඩම් හතර පාසල පවත්වන ලද දින 21 තුළ දී නියමිත පරිදි ආවරණය කර ඇති සේ සළකා පළමුවන වාරයේ ඉතිරි ව ඇති පාඩම් හතර යෝජිත කාලච්ඡේද 24ක් තුළ අවසන් කිරීමට යෝජනා කර ඇත.**

- **දෙවන වාරයේ 16. ද්‍රව මිනුම් සහ 17. ඝන වස්තු යන පාඩම් පිළිවෙළින් තුන්වන වාරයේ ආරම්භයට යොදා ඇත.**

මීට අමතර ව ඉගැන්වීමට යෝජනා කර ඇති සියලු ම පාඩම් හි සංකල්ප සාකච්ඡා කිරීම, එක් එක් වාරයට යෝජනා කර ඇති කාලච්ඡේද ගණන තුළ ආවරණය කිරීමටත් එම පාඩම් හි ඇතුළත් **අභ්‍යාස සහ ඝන වස්තුවල ආකෘති නිර්මාණය වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් නිවසේ සිට කිරීමට සිසුන්ව යොමු කිරීමටත් යෝජනා කර ඇත.** එක් එක් පාඩමට අදාළ ව කාලච්ඡේද වෙන් කර ගත යුතු ආකාරය පළමුවන, දෙවන හා තුන්වන වාරවලට අදාළ ව වෙන් වෙන් වශයෙන් විෂය නිර්දේශය යටතේ ඉදිරිපත් කර ඇත. වෙන් කර ඇති කාලච්ඡේද ගණන පාසලේ සිසුන්ගේ ස්වභාවය මත හා එක් එක් වාරයට යෝජනා කර ඇති කාලච්ඡේද ගණනට යටත්ව සංශෝධනය කර ගැනීමට මෙන් ම යෝජිත කාලච්ඡේද ගණන අවසන් වීමට ප්‍රථම පළමුවන හා දෙවන වාරයට යෝජනා කර ඇති පාඩම් ඉගැන්වීම අවසන් කරයි නම් **අත්‍යාවශ්‍ය නොවේ යැයි සළකා ඉවත් කර ඇති පාඩම්, සිසු ස්වයං අධ්‍යයනයට යොමු කිරීමට** ද දෙවන හා තුන්වන වාරයට අදාළ පාඩම් පිළිවෙලින් ඉගැන්වීම ආරම්භ කිරීමට ද ගුරුවරයාට නිදහස ඇත.

## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Loss - 2022)

### 06 ශ්‍රේණිය

(06 ශ්‍රේණියේ පළමුවන වාරයේ කාලච්ඡේද 24ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 34ක් ද බැගින් කාලච්ඡේද 92ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **06 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| වෘත්ත ආශ්‍රිත ජ්‍යාමිතික සංකල්ප පදනම් කර ගනිමින් නිගමනවලට එළඹීම සඳහා තර්කානුකූල චින්තනය මෙහෙයවයි. | වෘත්තාකාර හැඩ ඇසුරින් විවිධ මෝස්තර නිර්මාණය කරයි. | • ද්‍රව්‍ය අතුරින් වෘත්තාකාර හැඩ හඳුනා ගනියි.<br>• කාසි, වළලු වැනි ද්‍රව්‍ය ඇසුරින් වෘත්ත මෝස්තර නිර්මාණය කරයි.<br>(කවකටුව භාවිතය අපේක්ෂා නොකෙරේ) | • ද්‍රව්‍ය අතුරින් වෘත්තාකාර හැඩ<br>• වෘත්ත මෝස්තර<br>(කාසි, වළලු වැනි ද්‍රව්‍ය මගින්) | 01 | 1. වෘත්ත | පාසල පවත් වන ලද කාලය තුළ දී ආවරණය කර ඇත. |
| එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා තාත්වික සංඛ්‍යා කුලකය තුළ ගණිත කර්ම හසුරුවයි. | සංඛ්‍යාවල ප්‍රමාණාත්මක අගයයන් විමර්ශනය කරයි. | • සංඛ්‍යාවක එක් එක් ඉලක්කමේ ස්ථානීය අගය හඳුනා ගනියි.<br>• බිලියන කලාපය තෙක් සංඛ්‍යා කියවයි.<br>• බිලියන කලාපය තෙක් සංඛ්‍යා වචනයෙන් හා ඉලක්කමෙන් ලියයි. | • සංඛ්‍යා<br>• ස්ථානීය අගය<br>• බිලියන කලාපය තෙක් සංඛ්‍යා කියවීම හා ලිවීම (සම්මත ආකාරය) | 02 | 2. ස්ථානීය අගය | පාසල පවත් වන ලද කාලය තුළ දී ආවරණය කර ඇත. |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • බිලියන කලාපය තෙක් සංඛ්‍යා කියවීම හා ලිවීම ආශ්‍රිත ගැටලු විසඳයි. | | | | |
| එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා තාත්වික සංඛ්‍යා කුලකය තුළ ගණිත කර්ම හසුරුවයි. | ආකලනය හා ව්‍යාකලනය යටතේ පූර්ණ සංඛ්‍යා හසුරුවයි. | • පූර්ණ සංඛ්‍යා එකතු කරයි.<br>• පිළිතුර පූර්ණ සංඛ්‍යාවක් වන පරිදි පූර්ණ සංඛ්‍යා අඩු කරයි.<br>• පූර්ණ සංඛ්‍යා එකතු කිරීම හා අඩු කිරීම ආශ්‍රිත ගැටලු විසඳයි. | • පූර්ණ සංඛ්‍යා<br>• එකතු කිරීම<br>• අඩු කිරීම | 03 | 3. පූර්ණ සංඛ්‍යා මත ගණිත කර්ම | පාසල පවත් වන ලද කාලය තුළ දී ආවරණය කර ඇත. |
| | ගුණ කිරීම හා බෙදීම යටතේ පූර්ණ සංඛ්‍යා හසුරුවයි. | • පූර්ණ සංඛ්‍යා 10න් 100න් 1000න් ගුණ කරයි.<br>• පූර්ණ සංඛ්‍යා 10න් 100න් 1000න් බෙදයි.<br>• පූර්ණ සංඛ්‍යා ඉලක්කම් දෙකේ සංඛ්‍යාවලින් ගුණ කරයි.<br>• පූර්ණ සංඛ්‍යා ඉලක්කම් දෙකේ සංඛ්‍යාවලින් බෙදයි.<br>• පූර්ණ සංඛ්‍යා ගුණ කිරීම හා බෙදීම ආශ්‍රිත ගැටලු විසඳයි. | • ගුණ කිරීම හා බෙදීම<br>• 10න් 100න් 1000න්<br>• ඉලක්කම් දෙකේ සංඛ්‍යාවලින් | | | පාසල පවත් වන ලද කාලය තුළ දී ආවරණය කර ඇත. |
| වැඩ ලෝකයේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා | කාලය පිළිබඳ සැලකිලිමත් වෙමින් | • කාලය මනින ඒකක ලෙස තත්පර, මිනිත්තු, පැය, දින හඳුනා ගනියි. | • කාලය<br>• ඒකක (තත්පර, මිනිත්තු, පැය, දින) | 04 | 4. කාලය | පාසල පවත් වන ලද කාලය තුළ දී |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| කාලය කළමනාකරණය කර ගනියි. | දෛනික කටයුතු සැලසුම් කරයි. | • තත්පර හා මිනිත්තු අතරත් මිනිත්තු හා පැය අතරත් පැය හා දින අතරත් ඇති සම්බන්ධය හඳුනා ගනියි.<br>• යම් කාර්යයක් අවසන් කළ වෙලාවත් එම කාර්යය ආරම්භ කළ වෙලාවත් අතර වෙනස මගින් **ගතවූ කාලය** සොයයි.<br>• තත්පර හා මිනිතුවලින් දී ඇති, කාලය හා සම්බන්ධ එකතු කිරීම් කරයි.<br>• මිනිත්තු හා පැයවලින් දී ඇති, කාලය හා සම්බන්ධ එකතු කිරීම් කරයි.<br>• පැය සහ දිනවලින් දී ඇති, කාලය හා සම්බන්ධ එකතු කිරීම් කරයි.<br>• තත්පර හා මිනිත්තුවලින් දී ඇති, කාලය හා සම්බන්ධ අඩු කිරීම් කරයි.<br>• මිනිත්තු හා පැයවලින් දී ඇති, කාලය හා සම්බන්ධ අඩු කිරීම් කරයි.<br>• දෛනික කටයුතු කාල සටහනක් අනුව සැලසුම් කරයි. | • ගතවූ කාලය සෙවීම<br>• එකතු කිරීම සහ අඩු කිරීම | | | ආවරණය කර ඇත. |
| | වේලාව සහ දිනය සම්මත | • වේලාව පැය 24 ඔරලෝසුවෙන් (අන්තර් ජාතික සම්මත ආකාරයෙන්) ප්‍රකාශ කරයි. | • පැය 24 ඔරලෝසුව ⇄ පැය 12 ඔරලෝසුව | | | පාසල පවත් වන ලද කාලය තුළ දී |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | ආකාරයෙන් දක්වයි. | • පැය 24 ඔරලෝසුවේ වේලාව (අන්තර් ජාතික සම්මත ආකාරය) පැය 12 ඔරලෝසුවෙන් ප්‍රකාශ කරයි.<br>• පැය 12 ඔරලොසුවේ වේලාව පැය 24 ඔරලෝසුවෙන් (අන්තර් ජාතික සම්මත ආකාරයෙන්) ප්‍රකාශ කරයි.<br>• දිනය, yyyy.mm.dd ලෙස සම්මත ආකාරයට ලියා දක්වයි. | • දිනය ලිවීම (සම්මත ආකාරය) | | | ආවරණය කර ඇත. |
| එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා තාත්වික සංඛ්‍යා කුලකය තුළ ගණිත කර්ම හසුරුවයි. | ඍණ සංඛ්‍යා හැඳින්වීම සඳහා සංඛ්‍යා රේඛාව සම්බන්ධ කර ගනියි. | • සංඛ්‍යා රේඛාව මත පූර්ණ සංඛ්‍යා නිරූපණය කරයි.<br>• ඍණ සංඛ්‍යා හඳුනා ගනියි.<br>• නිර්මිත පරිසරයේ නිඛිල නිරූපිත අවස්ථා විග්‍රහ කරයි.<br>• ධන පූර්ණ සංඛ්‍යා, ඍණ පූර්ණ සංඛ්‍යා සහ ශුන්‍යය, නිඛිල ලෙස හඳුනා ගනියි.<br>• සංඛ්‍යා රේඛාව මත නිඛිල නිරූපණය කරයි. | • සංඛ්‍යා රේඛාව<br>• පූර්ණ සංඛ්‍යා නිරූපණය<br>• ඍණ සංඛ්‍යා හැඳින්වීම<br>• නිඛිල හැඳින්වීම<br>නිඛිල නිරූපණය | 05 | 5. සංඛ්‍යා රේඛාව | 06 |
| | සංඛ්‍යාවල විශාලත්වය පහසුවෙන් සන්නිවේදනය කර ගැනීම සඳහා | • නිඛිල යුගලක් > , < හෝ = හෝ සංකේතයක් මගින් සසඳයි.<br>• > , < හා = සංකේත භාවිතයෙන් නිඛිල සංසන්දනය කර පිළිවෙළට සකස් කරයි. | • නිඛිල සංසන්දනය හා පිළියෙල කිරීම<br>• > , < හා = සංකේත නාම භාවිතය | | | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | සංකේත භාවිත කරයි. | • අනුයාත නොවන නිඛිල දෙකක් අතර නිඛිලයක් ලියා දක්වයි. | • අනුයාත නොවන නිඛිල දෙකක් අතර නිඛිලයක් සෙවීම | | | |
| එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා තාත්වික සංඛ්‍යා කුලකය තුළ ගණිත කර්ම හසුරුවයි. | ගිනිය හැකි කට්ටලයක අවයව සංඛ්‍යාව සඳහා අගයක් නිමානය කරයි. | • ගිනිය හැකි කට්ටලයක අවයව සංඛ්‍යාව නිමානය කරන ආකාරය විස්තර කරයි.<br>• ගිනිය හැකි කට්ටලයක අවයව සංඛ්‍යාව නිමානය කරයි. | • නිමානය<br>• ගිනිය හැකි කට්ටලයක අවයව සංඛ්‍යාව | 06 | 6. නිමානය සහ වටැයීම | 04 |
| | සංඛ්‍යාවක් සඳහා ආසන්න අගයක් ලබා ගනිමින් සන්නිවේදනය හා ගණනය පහසුකර ගනියි. | • 100ට අඩු සංඛ්‍යා ආසන්න දහයේ ගුණාකාරයකට වටැයීමේ දී භාවිත කරනු ලබන රීති හඳුනා ගනියි.<br>• 100ට අඩු සංඛ්‍යා ආසන්න දහයේ ගුණාකාරයකට වටයයි. | • වටැයීම<br>• 100ට අඩු සංඛ්‍යා ආසන්න 10ට | | | 03 |
| විවිධ කෝණ අතර සම්බන්ධතා විමර්ශනය කරමින් තීරණ ගනියි. | සෘජුකෝණය ඇසුරින් කෝණ වර්ගීකරණය කරයි. | • සරල උදාහරණ මගින් කෝණය හඳුනා ගනියි.<br>• කෝණයක්, සෘජුකෝණයක්, සුළු කෝණයක්, මහා කෝණයක්, සරල කෝණයක් හෝ පරාවර්ත කෝණයක් වේ ද යන්න සෘජුකෝණය ඇසුරින් හඳුනා ගනියි.<br>• සෘජුකෝණය ඇසුරින් කෝණ වර්ගීකරණය කරයි.<br>• සෘජුකෝණ, සුළු කෝණ, මහා කෝණ, සරල කෝණ හා පරාවර්ත | • සෘජුකෝණය ඇසුරින් කෝණ වර්ග<br>• සෘජුකෝණය<br>• සුළුකෝණ<br>• මහා කෝණ<br>• සරල කෝණ<br>• පරාවර්ත කෝණ | 07 | 7. කෝණ | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | කෝණ අවට පරිසරයේ හඳුනා ගනියි. | | | | |
| විවිධ ක්‍රම විධි ගවේෂණය කරමින් ප්‍රායෝගික අවස්ථා සඳහා පරිමාණ රූප භාවිත කරයි. | දිශා පිළිබඳ ව විමසිලිමත් වෙමින් දෛනික කටයුතු සපුරා ගැනීමට පරිසරය සමග සම්බන්ධතා ගොඩනගයි. | • අට දිශා හඳුනා ගනියි.<br>• අට දිශා ඇසුරින් යම් ස්ථානයක පිහිටීමක දිශාව විස්තර කරයි.<br>• දෙන ලද පිහිටීමක සිට වෙනත් ස්ථානයක පිහිටීමක දිශාව අට දිශා ඇසුරින් ප්‍රකාශ කරයි.<br>• පොළවට සාපේක්ෂ ව සිරස හා තිරස හඳුනා ගනියි.<br>• දිශා පිළිබඳ ව විමසිලිමත් වෙමින් දෛනික කටයුතු සැලසුම් කරයි. | • අට දිශා<br>• සිරස හා තිරස (පොළවට සාපේක්ෂ ව) | 08 | 8. දිශා | 04 |
| | | | | | පළමු වාරයේ කාලච්ඡේදවල සමස්ත එකතුව | 24 |
| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
| **06 ශ්‍රේණිය දෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා පහසුවෙන් ඉටු කර ගැනීම සඳහා ඒකක හා ඒකක කොටස් | ඒකක භාග හා නියම භාග හඳුනා ගනියි. | • ඒකකයකින්/සමූහයකින් කොටසක් හෝ කොටස් කිහිපයක් භාගය ලෙස හඳුනා ගනියි.<br>• ඒකක භාග හා නියම භාග හඳුනා ගනියි. | • භාග හැඳින්වීම<br>• ඒකකයකින් කොටසක් ලෙස හා සමූහයකින් කොටසක් ලෙස<br>• ඒකක භාග | 09 | 09. භාග | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| තුළ ගණිත කර්ම හසුරුවයි. | | | • නියම භාග (තත්‍ය භාග) | | | |
| | තුල්‍ය භාග හඳුනා ගනියි. | • භාගයකට තුල්‍ය වූ භාග සොයන ආකාරය විස්තර කරයි.<br>• භාගයකට තුල්‍ය වූ භාග සොයයි. | • තුල්‍ය භාග හැඳින්වීම | | | 01 |
| | භාග සසඳමින් ගැටලු විසඳයි. | • ඒකක භාග සංසන්දනය කරයි.<br>• හරය සමාන භාග සංසන්දනය කරයි.<br>• ලවය සමාන භාග සංසන්දනය කරයි.<br>• හරය සම්බන්ධිත භාග සංසන්දනය කරයි.<br>• ඒකක භාග, හරය සමාන භාග, ලවය සමාන භාග හා හරය සම්බන්ධිත භාග සැසඳීම ආශ්‍රිත ගැටලු විසඳයි. | • භාග සංසන්දනය<br>  • හරය සමාන<br>  • ඒකක භාග<br>  • ලවය සමාන<br>  • හරය සම්බන්ධිත | | | 03 |
| | ආකලනය හා ව්‍යාකලනය යටතේ ඒකකයකින් කොටස් හසුරුවයි. | • පිළිතුර නියම භාගයක් වන පරිදි, සමාන හර සහිත භාග එකතු කර සුළු කරයි.<br>• පිළිතුර නියම භාගයක් වන පරිදි, සමාන හර සහිත භාග අඩු කර සුළු කරයි. | • එකතු කිරීම හා අඩු කිරීම<br>  • හරය සමාන<br>  • හරය සම්බන්ධිත | | | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • පිළිතුර නියම භාගයක් වන පරිදි, සම්බන්ධිත හර සහිත භාග එකතු කර සුළු කරයි.<br>• පිළිතුර නියම භාගයක් වන පරිදි, සම්බන්ධිත හර සහිත භාග අඩු කර සුළු කරයි.<br>• හරය සමාන හා හරය සම්බන්ධිත භාග එකතු කිරීම හා අඩු කිරීම ආශ්‍රිත ගැටලු විසඳයි. | | | | |
| එදිනෙදා ජීවිතයේ කටයුතු පහසු කර ගැනීම සඳහා කුලක ආශ්‍රිත මූලධර්ම හසුරුවයි. | සමූහයක්, පොදු ලක්ෂණ ඇසුරින් කාණ්ඩ කරයි. | • සමූහයක්, පොදු වූ ලක්ෂණ ඇති කාණ්ඩවලට වෙන් කරයි.<br>• සමූහයක් කාණ්ඩවලට වෙන් කිරීමට පදනම් වූ හේතු දක්වයි.<br>• පොදු ලක්ෂණයට අනුව කාණ්ඩ නම් කරයි. | • තේරීම<br>• කාණ්ඩ සඳහා නාම | 10 | 10. තේරීම | 02 |
| එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා තාත්වික සංඛ්‍යා කුලකය තුළ ගණිත කර්ම හසුරුවයි. | පූර්ණ සංඛ්‍යාවල සාධක හා ගුණාකාර විමර්ශනය කරයි. | • 10 × 10 ගුණන වගුව භාවිතයෙන් සංඛ්‍යාවල සාධක සොයයි.<br>• 10 ×10 ගුණන වගුව භාවිතයෙන් සංඛ්‍යාවල ගුණාකාර සොයයි.<br>• 10 ×10 ගුණන වගුවේ ඇතුළත් නොවන සංඛ්‍යාවල සාධක හා ගුණාකාර බෙදීමෙන් හා ගුණ කිරීමෙන් සොයයි. | • සාධක හා ගුණාකාර (100 තෙක්)<br>• 10 × 10 ගුණන වගුව භාවිතය<br>• වෙනත් ක්‍රම මගින් | 11 | 11. සාධක හා ගුණාකාර | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • සාධක හා ගුණාකාර ආශ්‍රිත ගැටලු විසඳයි. | | | | |
| | සංඛ්‍යාවක් තවත් සංඛ්‍යාවකින් බෙදෙන්නේ දැයි පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි ක්‍රම විමර්ශනය කරයි. | • සංඛ්‍යාවක් 2න් 5න් හා 10න් බෙදෙන්නේ දැයි නිරීක්ෂණය කළ හැකි ක්‍රම හඳුනා ගනියි.<br>• හඳුනාගත් ක්‍රම භාවිතයෙන් සංඛ්‍යාවක් 2න් 5න් හා 10න් බෙදෙන්නේ දැයි පරීක්ෂා කරයි.<br>• හඳුනාගත් ක්‍රම භාවිතයෙන් ගැටලු විසඳයි. | • භාජ්‍යතා රීති<br>• 2න් 5න් සහ 10න් | | | 03 |
| එදිනෙදා ජීවිතයේ කටයුතු වල දී අවශ්‍ය නිගමනවලට එළඹීම සඳහා සරල රේඛීය තල රූප ආශ්‍රිත ජ්‍යාමිතික සංකල්ප යොදා ගනියි. | සරල රේඛීය තලරූපවල හැඩතල පිළිබඳ විමර්ශනය කරයි. | • සෘජුකෝණාස්‍රය, සමචතුරස්‍රය, ත්‍රිකෝණය, සමාන්තරාස්‍රය, ත්‍රපීසියම යන සරල රේඛීය තලරූපවල සුවිශේෂී ලක්ෂණ හඳුනා ගනියි.<br>• සෘජුකෝණාස්‍රය, සමචතුරස්‍රය, ත්‍රිකෝණය, සමාන්තරාස්‍රය, ත්‍රපීසියම යන සරල රේඛීය තලරූප කොටු දැලක අඳියි.<br>• නිර්මිත පරිසරයේ ඇති සෘජුකෝණාස්‍ර, සමචතුරස්‍ර, ත්‍රිකෝණ, සමාන්තරාස්‍ර හා ත්‍රපීසියම් හැඩ විස්තර කරයි. | • සරල රේඛීය තලරූප කොටු දැලක ඇඳීම සහ ඒවායේ ලක්ෂණ<br>• සෘජුකෝණාස්‍රය<br>• සමචතුරස්‍රය<br>• ත්‍රිකෝණය<br>• සමාන්තරාස්‍රය<br>• ත්‍රපීසියම | 12 | 12. සරල රේඛීය තලරූප | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා පහසුවෙන් ඉටු කර ගැනීම සඳහා ඒකක හා ඒකක කොටස් තුළ ගණිත කර්ම හසුරුවයි. | දශම සංඛ්‍යා හඳුනා ගනිමින් සසඳයි. | • දශම සංඛ්‍යා හඳුනා ගනියි.<br>• දශමස්ථාන දෙකක් තෙක් දශම සංඛ්‍යා සංසන්දනය කරමින් පටිපාටි ගත කරයි.<br>• දශම සංඛ්‍යා සංසන්දනය ආශ්‍රිත ගැටලු විසඳයි. | • දශම<br>• හැඳින්වීම<br>• සංසන්දනය | 13 | 13. දශම | 02 |
| | ආකලනය හා ව්‍යාකලනය යටතේ දශම සංඛ්‍යා හසුරුවයි. | • දශමස්ථාන දෙකක් තෙක් දශම සංඛ්‍යා එකතු කරයි.<br>• දශමස්ථාන දෙකක් තෙක් දශම සංඛ්‍යා අඩු කරයි.<br>• දශම සංඛ්‍යා එකතු කිරීම හා අඩු කිරීම ආශ්‍රිත ගැටලු විසඳයි. | • දශම<br>• එකතු කිරීම<br>• අඩු කිරීම | | | 02 |
| සංඛ්‍යාවල ඇති විවිධ සම්බන්ධතා විමර්ශනය කරමින් ඉදිරි අවශ්‍යතා සඳහා තීරණ ගනියි. | සංඛ්‍යාවල ලක්ෂණ පදනම් කරගනිමින් සංඛ්‍යා වර්ගීකරණය කරයි. | • ඔත්තේ සංඛ්‍යා සහ ඉරට්ට සංඛ්‍යා ලෙස පූර්ණ සංඛ්‍යා වර්ගීකරණය කරයි.<br>• ඔත්තේ සංඛ්‍යා සහ ඉරට්ට සංඛ්‍යාවල ඓක්‍යයේ, අන්තරයේ සහ ගුණිතයේ ගුණ හඳුනා ගනියි.<br>• ප්‍රථමක සංඛ්‍යා සහ සංයුක්ත සංඛ්‍යා හඳුනා ගනියි.<br>• ප්‍රථමක සංඛ්‍යා සහ සංයුක්ත සංඛ්‍යා ලෙස පූර්ණ සංඛ්‍යා වර්ගීකරණය කරයි. | • සංඛ්‍යා වර්ග<br>• ඔත්තේ සහ ඉරට්ට<br>• ඔත්තේ සහ ඉරට්ට සංඛ්‍යා අතර සම්බන්ධය<br>• එකතු කිරීම, අඩු කිරීම සහ ගුණ කිරීම<br>• ප්‍රථමක හා සංයුක්ත<br>• සමචතුරස්‍ර සංඛ්‍යා සහ ත්‍රිකෝණ සංඛ්‍යා | 14 | 14. සංඛ්‍යා වර්ග හා සංඛ්‍යා රටා | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • සමචතුරස්‍ර සංඛ්‍යා සහ ත්‍රිකෝණ සංඛ්‍යා හඳුනා ගනියි.<br>• දෙනලද පූර්ණ සංඛ්‍යා සමූහයක ඇති සමචතුරස්‍ර සංඛ්‍යා සහ ත්‍රිකෝණ සංඛ්‍යා තෝරා කාණ්ඩ කරයි. | | | | |
| | සංඛ්‍යා අනුක්‍රමයක රටාව නිශ්චය කරයි. | • සමචතුරස්‍ර සංඛ්‍යා සහ ත්‍රිකෝණ සංඛ්‍යා ඇතුළු සරල සංඛ්‍යා රටා හඳුනා ගනියි.<br>• සංඛ්‍යා රටා ආශ්‍රිත ගැටලු විසඳයි. | • සංඛ්‍යා රටා<br>• සරල සංඛ්‍යා රටා (ඔත්තේ සහ ඉරට්ට ඇතුළත්)<br>• සමචතුරස්‍ර සංඛ්‍යා<br>• ත්‍රිකෝණ සංඛ්‍යා | | | 03 |
| දෛනික කටයුතු ඵලදායි ලෙස ඉටු කර ගැනීම සඳහා පරිමිතිය සෙවීමේ විවිධ ක්‍රම විමර්ශනය කරයි. | සුදුසු ඒකක භාවිත කරමින් දිග ආශ්‍රිත මිනුම් යොදෙන අවස්ථා විමර්ශනය කරයි. | • උස, පළල, ගැඹුර, ඝනකම ආදිය දිග ලෙස හඳුනා ගනියි.<br>• දෙන ලද දිගක් මැනීම සඳහා සුදුසු ඒකකය mm, cm, m, km අතුරින් තෝරා ගනියි.<br>• සුදුසු මිනුම් උපකරණයක් තෝරාගෙන එය භාවිතයෙන් දිග මනියි.<br>• දිග මැනීමේ ඒකක අතර සම්බන්ධය ප්‍රකාශ කරයි. | • දිග<br>• සංකල්ප (උස, දුර, ගැඹුර, පළල, ඝනකම දිගක් ලෙස)<br>• ඒකක (mm, cm, m, km)<br>• දිග මැනීම<br>• පරිවර්තනය (mm $\rightleftharpoons$ cm $\rightleftharpoons$ m $\rightleftharpoons$ km)<br>• නිමානය | 15 | 15. දිග | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • $\text{cm} \rightleftharpoons \text{mm}, \text{cm} \rightleftharpoons \text{m}, \text{m} \rightleftharpoons \text{km}$ පරිවර්තනය කරයි.<br>• උස, ගැඹුර, පළල, ඝනකම නිමානය කරයි. | | | | |
| | සරල රේඛීය තලරූපවල පරිමිතිය සෙවීම සඳහා දිග ආශ්‍රිත මිනුම් සම්බන්ධ කරයි. | • දී ඇති සරල රේඛීය තල රූපයක වටේ දිග එහි **පරිමිතිය** ලෙස හඳුනා ගනියි.<br>• මිනුම් දෙන ලද සරල රේඛීය තල රූපයක පරිමිතිය සොයයි. | • පරිමිතිය සෙවීම | | | 02 |
| දෙවන වාරයේ කාලච්ඡේදවල සමස්ත එකතුව | | | | | | 34 |
| **06 ශ්‍රේණිය තුන්වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ද්‍රව මිනුම් පිළිබඳ ව විචාරශීලී ව කටයුතු කරයි. | දෛනික කටයුතුවල දී ද්‍රව ආශ්‍රිත මිනුම් යොදා ගනියි. | • ද්‍රව ප්‍රමාණ මැනීම සඳහා $ml, l$ භාවිත කරන බව හඳුනා ගනියි.<br>• දෙන ලද ද්‍රව ප්‍රමාණයක් මැනීම සඳහා $ml, l$ අතුරින් සුදුසු ඒකකය තෝරා ගනියි.<br>• $ml$ සහ $l$ අතර සම්බන්ධය ප්‍රකාශ කරයි.<br>• දෙන ලද ද්‍රව ප්‍රමාණ $ml$ හා $l$ වලින් නිමානය කරයි. | • ද්‍රව මිනුම්<br>  • ඒකක $(ml, l)$<br>  • පරිවර්තනය $(ml \rightleftharpoons l)$<br>  • ද්‍රව ප්‍රමාණ නිමානය<br>  • මිනුම් $(ml, l)$<br>    • එකතු කිරීම<br>    • අඩු කිරීම | 16 | 16. ද්‍රව මිනුම් | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • $ml \rightleftharpoons l$ ඒකක පරිවර්තනය කරයි.<br>• $ml, l$ ඇතුළත් ද්‍රව පරිමා එකතු කරයි.<br>• $ml, l$ ඇතුළත් ද්‍රව පරිමා අඩු කරයි.<br>• දෛනික කටයුතුවල දී ද්‍රව පරිමා මැනීම සඳහා සුදුසු ඒකක භාවිත කරයි. | | | | |
| විවිධ ඝනවස්තු පිළිබඳ ගවේෂණය කරමින් නව නිර්මාණකරණයේ යෙදෙයි. | ඝනවස්තුවල ලක්ෂණ විමර්ශනය කරයි. | • දෙන ලද පතරම් ඇසුරින් ඝනකය, ඝනකාභය හා සවිධි චතුස්තලය යන ඝනවස්තුවල ආකෘති නිර්මාණය කරයි.<br>• ඝනකය, ඝනකාභය සහ සවිධි චතුස්තලයේ ශීර්ෂ, දාර හා මුහුණත් ගණන ප්‍රකාශ කරයි.<br>• මුහුණත් හි ජ්‍යාමිතික හැඩ හඳුනාගෙන නම් කරයි.<br>• ඝනකය, ඝනකාභය සහ සවිධි චතුස්තලය සඳහා විවිධ පතරම් නිර්මාණය කරයි.<br>• ඝනකය, ඝනකාභය සහ සවිධි චතුස්තලය ඇතුළත් සංයුක්ත ඝනවස්තු නිර්මාණය කරයි. | • ආකෘති නිර්මාණය<br>  • ඝනකය<br>  • ඝනකාභය<br>  • සවිධි චතුස්තලය<br>• ශීර්ෂ, දාර, මුහුණත්<br>  • ඝනකය<br>  • ඝනකාභය<br>  • සවිධි චතුස්තලය | 17 | 17. ඝන වස්තු | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| විවිධ ක්‍රම ක්‍රමානුකූල ව ගවේෂණය කරමින් වීජීය ප්‍රකාශන සුළුකරයි. | අවස්ථානුකූලව වීජීය සංකේතවලින් විචල්‍ය නිරූපණය කරයි. | • සම්මත සංකේත ඇසුරින් නිරූපිත තොරතුරු විස්තර කරයි.<br>• නොදන්නා නියත අගයයන් **අඥාත නියත** ලෙස හඳුනා ගනියි.<br>• කිසියම් පරාසයක් තුළ වූ ඕනෑ ම අගයක් ගතහැකි රාශියක් **විචල්‍යයක්** ලෙස හඳුනා ගනියි.<br>• අවශ්‍යතාව අනුව වීජීය සංකේතයක් ඇසුරෙන් අඥාත නියතයක් නිරූපණය කරයි.<br>• අවශ්‍යතාව අනුව වීජීය සංකේතයක් ඇසුරෙන් විචල්‍යයක් නිරූපණය කරයි. | • වීජීය සංකේත ඇසුරින් අඥාත නියත පද නිරූපණය<br>• අවශ්‍යතාව අනුව වීජීය සංකේතයක් ඇසුරෙන් විචල්‍යයක් නිරූපණය | 18 | 18. වීජීය සංකේත | 03 |
| | එකතු කිරීම හෝ අඩු කිරීම හෝ යොදා ගනිමින් සරල වීජීය ප්‍රකාශන අර්ථාන්විත ව ගොඩනගා ආදේශයෙන් අගය සොයයි. | • එකතු කිරීමේ ගණිත කර්මය යොදා ගනිමින් සංගුණකය 1 වූ එක් අඥාතයක් සහිත වීජීය ප්‍රකාශන ගොඩ නගයි.<br>• අඩු කිරීමේ ගණිත කර්මය යොදා ගනිමින් සංගුණකය 1 වූ එක් අඥාතයක් සහිත වීජීය ප්‍රකාශන ගොඩනගයි.<br>• පූර්ණ සංඛ්‍යා ආදේශ කරමින් සංගුණකය 1 වූ එක් අඥාතයක් | • එකතු කිරීම හෝ අඩු කිරීම හෝ යොදා ගනිමින් වීජීය ප්‍රකාශන ගොඩනැගීම<br>  • සංගුණකය 1 වූ එක් අඥාතයක් සහිත<br>• වීජීය ප්‍රකාශනයක ආදේශය (පූර්ණ සංඛ්‍යා)<br>• සංගුණකය 1 වූ එක් අඥාතයක් සහිත | 19 | 19. වීජීය ප්‍රකාශන ගොඩනැගීම හා ආදේශය | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | සහිත වීජීය ප්‍රකාශනයක අගය සොයයි. | | | | |
| දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ස්කන්ධය පිළිබඳ දැනුම භාවිත කරයි. | දෛනික අවශ්‍යතාවල දී ස්කන්ධය ආශ්‍රිත මිනුම් භාවිත කරයි. | • වස්තුවක අඩංගු පදාර්ථ ප්‍රමාණය එහි **ස්කන්ධය** ලෙස හඳුනා ගනියි.<br>• දෙන ලද ස්කන්ධයක් මැනීම සඳහා $g$ , $kg$ අතුරින් සුදුසු ඒකකය තෝරා ගනියි.<br>• $g$ , $kg$ අතර සම්බන්ධය ප්‍රකාශ කරයි.<br>• $g \rightleftharpoons kg$ ඒකක පරිවර්තනය කරයි.<br>• $g$ , $kg$ ඇතුළත් ස්කන්ධ එකතු කරයි.<br>• $g$ , $kg$ ඇතුළත් ස්කන්ධ අඩු කරයි.<br>• දෛනික කටයුතුවල දී ස්කන්ධය මැනීම සඳහා සුදුසු ඒකක භාවිත කරයි. | • ස්කන්ධය<br>  • සංකල්පය<br>  • ඒකක $(g , kg)$<br>  • පරිවර්තනය $(g \rightleftharpoons kg)$<br>  • මිනුම් $(g , kg)$<br>    • එකතු කිරීම<br>    • අඩු කිරීම | 20 | 20. ස්කන්ධය | 03 |
| එදිනෙදා ජීවිතයේ කටයුතු පහසුකර ගැනීම සඳහා අනුපාත යොදා ගනියි. | රාශීන් අතර සම්බන්ධතා ගොඩනගයි. | • රාශි දෙකක් අතර අනුපාතය යන සංකල්පය විස්තර කරයි.<br>• අනුපාතයකට තුල්‍ය වූ අනුපාත සොයයි.<br>• අනුපාතයක් සරල ම ආකාරයෙන් ලියයි. | • අනුපාත<br>  • සංකල්පය<br>  • තුල්‍ය අනුපාත<br>  • සරල ම ආකාරය (රාශි දෙකක් අතර) | 21 | 21. අනුපාත | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • සරල ගනුදෙනුවල දී සහ වෙනත් ප්‍රායෝගික අවස්ථාවල දී අනුපාතික යොදා ගනියි. | • අනුපාතික භාවිත | | | |
| දෛනික කටයුතු පහසු කර ගැනීම සඳහා දත්ත නිරූපණය කිරීමේ විවිධ ක්‍රම විමර්ශනය කරයි. | දත්ත රැස්කිරීමේ ක්‍රම සහ නිරූපණය කිරීමේ පහසු ක්‍රම සොයා බලයි. | • දත්ත රැස්කිරීමේ ක්‍රමයක් ලෙස ප්‍රගණන ලකුණ භාවිත කරයි.<br>• ප්‍රගණන ලකුණු භාවිතයෙන් කාණ්ඩ පහකට නොවැඩි 100 ට අඩු දත්ත රැස්කරයි.<br>• වගු මගින් දත්ත නිරූපණය කරයි.<br>• චිත්‍ර ප්‍රස්තාර මගින් දත්ත නිරූපණය කරයි.<br>(චිත්‍රයකින් $\frac{1}{2}$ , $\frac{1}{4}$ යෙදෙන අවස්ථා සහිතව) | • දත්ත<br>• රැස් කිරීම ප්‍රගණන ලකුණු මගින් (කාණ්ඩ පහකට නොවැඩි 100ට අඩු දත්ත)<br>• නිරූපණය<br>• වගු මගින්<br>• චිත්‍ර ප්‍රස්තාර මගින් | 22 | 22. දත්ත රැස්කිරීම සහ නිරූපණය | 04 |
| දෛනික කටයුතු පහසු කර ගැනීම සඳහා දත්ත විවිධ ක්‍රම මගින් විශ්ලේෂණය කරමින් පුරෝකථනය කරයි. | විවිධ ක්‍රම මගින් නිරූපිත දත්ත අර්ථකථනය කරයි. | • වගු මගින් නිරූපිත දත්ත අර්ථකථනය කරයි.<br>• චිත්‍ර ප්‍රස්තාර මගින් නිරූපිත දත්ත අර්ථකථනය කරයි. | • දත්ත අර්ථකථනය<br>• වගු මගින්<br>• චිත්‍ර ප්‍රස්තාර මගින් | 23 | 23. දත්ත අර්ථකථනය | 03 |
| එදිනෙදා ජීවිතයේ ගැටලු පහසුවෙන් විසඳා ගැනීම සඳහා | නිරූපණය පහසු කර ගැනීම සඳහා සංඛ්‍යා හා | • දර්ශක අංකනය හඳුනාගෙන භාවිත කරයි. | • දර්ශක<br>• අංකනය | 24 | 24. දර්ශක | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| ලඝුගණක හා ගණක භාවිත කරයි. | බල අතර සම්බන්ධතා ගොඩනගයි. | • පූර්ණ සංඛ්‍යාවක බලයක් ලෙස ලිවිය හැකි සංඛ්‍යාවක් බලයක් ලෙස ලියා දක්වයි.<br>• බලයක් ප්‍රසාරණය කර එහි අගය ලියා දක්වයි. | • සංඛ්‍යාව ( 100ට අඩු $\rightleftarrows$ බලය<br>•බල විහිදුවීම | | | |
| වර්ගඵලය පිළිබඳ ව විමර්ශනය කරමින් සීමිත ඉඩකඩ ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගනියි. | සරල රේඛීය තලරූපවල වර්ගඵලය විමර්ශනය කරයි. | • මායිමකින් වටවී ඇති පෘෂ්ඨයක ඉඩ ප්‍රමාණය එහි **වර්ගඵලය** ලෙස හඳුනා ගනියි.<br>• අභිමත ඒකක භාවිතයෙන් වර්ගඵලය මනියි.<br>• වර්ගඵලය මැනීම සඳහා ඒකකයක් ලෙස $cm^2$ හඳුනා ගනියි.<br>• $1\ cm \times 1\ cm$ කොටු ජාලකයක් ඇසුරින් සමචතුරස්‍රවල සහ සෘජුකෝණාස්‍රවල වර්ගඵලය සොයයි.<br>• $1\ cm^2$ සමචතුරස්‍රාකාර ආස්තර භාවිතයෙන් දී ඇති වර්ගඵලයකින් යුතු අර්ථවත් තලරූප නිර්මාණය කරයි. | • වර්ගඵලය<br>• සංකල්පය<br>• ඒකක $(cm^2)$<br>• සමචතුරස්‍රවල වර්ගඵලය<br>• සෘජුකෝණාස්‍රවල වර්ගඵලය<br>($1\ cm^2$ කොටු ජාලකයක් භාවිතයෙන්) | 25 | 25. වර්ගඵලය | 03 |
| තුන්වන වාරයේ කාලච්ඡේදවල සමස්ත එකතුව | | | | | | 34 |